සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2023-08-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු වන **ජේසන්**, 2022 මැයි 01 දින සිට වසර තුනක කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙකු ලෙස පත්කර තිබේ. ඔහුට කොළඹ පිහිටි මහල් නිවාසයක් (apartment) සපයා ඇති අතර, ඔහුගේ වැටුප ඕස්ට්‍රේලියාවේ ඇති ඔහුගේ බැංකු ගිණුමට බැර කරනු ලැබේ.

රාජකාරි භාරගත් පසු, 2022/23 තක්සේරු වර්ෂය පුරාවටම ඔහු ශ්‍රී ලංකාවේ රැඳී සිට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, 2022/23 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතුවලට අදාලව **ජේසන්ගේ** වාසිකභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**රණසිංහ,** ඔහුගේ පවුල සමග ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට සැලසුම් කරන අතර, 2022/23 තක්සේරු වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රාග්ධන විකුණුම් ගනුදෙනු සිදුකර තිබේ:

| වත්කම් වර්ගය | ගැනුම් පිරිවැය / 2017 සැප්තැම්බර් 30 දිනට වටිනාකම (රු.) | තැරැව්කරුගේ ගාස්තු (රු.) | ලැබුණු ප්‍රතිෂ්ඨාව (රු.) |
|---|---|---|---|
| ගෘහ භාණ්ඩ සහිත ස්ථිර වාසස්ථානය | 98,500,000 | 5,000,000 | 110,000,000 |
| වගුරු බිම - මිනුවන්ගොඩ | 8,000,000 | 500,000 | 9,200,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත ගනුදෙනු මත **රණසිංහ** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ මත බද්ද (Capital Gain Tax) **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) **රණසිංහ** විසින් ප්‍රාග්ධන ලාභ මත බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 01)
(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සිරිපාල** සහ **ගුණපාල** සමානව ලාභා'ලාභ බෙදා ගනිමින් **ගුණසිරි බේකර්ස්** නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යති. **සිරිපාලට** පුතුන් දෙදෙනෙකු සිටින අතර, **ගුණසිරි බේකර්ස්** හි ඔහුගේ ලාභ කොටස බෙදාගැනීම සඳහා ඔහු, ඔහුගේ පුතුන් දෙදෙනා සමඟ නව හවුල් ගිවිසුමකට එළඹුණේය.

මෙම නව හවුල් ව්‍යාපාරයේ එකම ආදායම වන්නේ **ගුණසිරි බේකර්ස්** වෙතින් **සිරිපාලට** ලැබුණු භාගයක ලාභ කොටස පමණි.

**සිරිපාල** සහ ඔහුගේ පුතුන් අතර, වලංගු ව්‍යාපාරයක් නොමැති බව සඳහන් කරමින් ඔවුන් අතර පවත්නා ගිවිසුම සහකාර කොමසාරිස්වරයා අභියෝගයට ලක්කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් සහ ඒ.ඒ. ඩාවුඩ්බෝයි (A.A. Davordboy Vs CGIR) එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නඩු තීන්දුව පදනම් කර ගනිමින් **සිරිපාල** සහ ඔහුගේ පුතුන් අතර, බදු කටයුතු සඳහා වලංගු හවුල් ව්‍යාපාරයක් පවතින්නේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

**සීමාසහිත VFC (පෞද්ගලික) සමාගම,** සපත්තු ආනයනය කර දේශීය වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටින අතර, එකතු කළ අගය මත බද්ද [Value Added Tax (VAT)] සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද [Social Security Contribution Levy (SSCL)] සඳහා ලියාපදිංචි වී සිටියි. මෑතකදී බඳවාගත් ගණකාධිකාරීවරයා පහත කරුණු සම්බන්ධව මූලික උපදෙසක් ලබාගැනීම සඳහා ඔබ වෙත පැමිණ සිටියි.

බදු උපදේශකවරයා වශයෙන්;

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එකතු කළ අගය මත බදු (VAT) පනතට අනුව, වලංගු බදු ඉන්වොයිසියක ඇතුළත් විය යුතු අයිතම (items) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සපත්තුවල පිරිවැටුම මත අදාල වන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) අනුපාතය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

**සීමාසහිත සුපර් (පෞද්ගලික) සමාගම,** එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි පුද්ගලයෙකු වන අතර, ආරක්ෂක සේවා සැපයීමේ නිරතව සිටියි. තවද, සමාගම ආනයනය කරන ලද ආරක්ෂිත උපකරණ, දේශීය වෙළෙඳපොළේ විකිණීමද සිදු කරයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා වූ පහත සඳහන් තොරතුරු සමාගමේ ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී සිදුවූ විකුණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ (VAT රහිතව):

| | රු. |
|---|---:|
| දේශීය වෙළෙඳපොළේ ආරක්ෂිත උපකරණ විකිණීම | 8,540,000 |
| දේශීය සේවාදායකයින්ට සැපයූ සේවා | 14,580,000 |
| පැරණි කාර්යාල ගෘහ භාණ්ඩ විකිණීම | 74,000 |

(2) සමාගම, කාර්තුව තුළදී පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---:|
| ආරක්ෂිත උපකරණ ආනයන මත | 1,465,000 |
| දේශීය මිලදී ගැනුම් මත | 1,234,000 |
| සේවාදායක ස්ථාන වෙත යාමට නිලධාරීන් විසින් භාවිත කරන යතුරු පැදිවල අළුත්වැඩියා මත | 22,500 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.454,000/- කි.

(4) සමාගම, මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.200,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 15% ක් ලෙස සළකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත රන් සිහින (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2021 මැයි 01 දින සංස්ථාපනය කරන ලද අතර, එදිනම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. සමාගම, ස්වර්ණාභරණ නිෂ්පාදන ව්‍යාපාරයේ නිරතව සිටී. සමාගම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටියද 2021/22 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව තවම ඉදිරිපත් කර නොතිබුණි. එසේම, තක්සේරු වර්ෂය තුළදී කිසිදු ආදායම් බදු ගෙවීමක් සිදුකර නොමැත.

සහකාර කොමසාරිස්, ඔහුගේ විනිශ්චය මත පදනම්ව පැහැර හරින ලද තක්සේරුවක් (default assessment) නිකුත් කර තිබේ. ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීම සඳහා බලයලත් නියෝජිත වශයෙන් ඔබව පත්කිරීමට සමාගම බලාපොරොත්තු වෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 195 වන වගන්තිය අනුව, සමාගම විසින් බලයලත් නියෝජිතයෙකු වශයෙන් පත්කරනු ලැබිය හැකි තැනැත්තන් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් අනුව, ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මත අදාළ වන දණ්ඩන (penalties) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) "ස්ව-තක්සේරුවක්" සහ "පැහැර හරින ලද තක්සේරුවක්" අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)
(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**ශෙරානි ෆ්ලෝරා, ශෙරානි** සහ **ඉරානි** යන මිතුරියන් දෙදෙනා විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයක් වන අතර, ඔවුන් නුවරඑළියේ මල් ගොවිපොළක් පවත්වාගෙන යති. ඔවුහු ලාභා'ලාභ පිළිවෙළින් 2:1 අනුපාතයට බෙදා ගැනීමට එකඟ වී සිටිති.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. |
|---|---:|
| දළ ලාභය | 6,750,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම (දළ) | 2,100,000 |
| | **8,850,000** |
| අඩු කළා: පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් | (3,250,000) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **5,600,000** |

ඉහත ලාභය ගණනය කිරීමේදී, පහත සඳහන් වියදම් අඩු කර ගෙන තිබේ:

(1) මාසික වැටුප වශයෙන් එක් අයෙකුට රු.135,000/- බැගින් හවුල්කරුවන් දෙදෙනාම ලබාගෙන තිබේ.

(2) **ශෙරානි** ට අයත් ඉඩමක මල් පැළ වගාකර තිබෙන අතර, ඒ සඳහා රු.80,000/- ක බිම් කුලියක් සෑම මසකදීම ගෙවනු ලැබේ.

(3) තක්සේරු වර්ෂය තුළදී වැඩිහිටි පුද්ගලයින් සඳහා ආයතනිකමය රැකවරණය සැපයීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට රු.300,000/- ක මුදලක් පරිත්‍යාග කර තිබේ.

(4) **ඉරානිගේ** ස්වාමි පුරුෂයා හවුල් ව්‍යාපාරයේ කළමනාකරු වශයෙන් කටයුතු කරන අතර, වර්ෂය තුළදී ඔහුගේ වැටුප වශයෙන් රු.600,000/- ක් ගෙවා තිබේ.

(5) වර්ෂය තුළදී, රු.3,600,000/- ක පිරිවැයකට අධි තාක්ෂණික කෘෂිකාර්මික යන්ත්‍රයක් මිලදීගෙන ඇති අතර, පරිපාලන වියදම් යටතේ රු.360,000/- ක් ක්ෂය වශයෙන් වාර්තා කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 50)

### **08** වන ප්‍රශ්නය

**සීමාසහිත හයි ටෙක් පොදු සමාගමේ** පරිපාලිත සමාගමක් වන **සීමාසහිත මොඩර්න් ටෙක් (පෞද්ගලික) සමාගම,** සංගීත උපකරණ ආනයනය කර දේශීය වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටී.

පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත මොඩර්න් ටෙක් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන තිබේ:

***(2022/23 තක්සේරු වර්ෂයේදී හඳුන්වා දෙන ලද ආදායම් බදු සංශෝධන, කාලපරිච්ඡේදය නොසලකා සම්පූර්ණ තක්සේරු වර්ෂය සඳහාම අදාළ වන බව ඔබට සැළකිය හැකිය) :***

(1) සියලු වියදම් අයකිරීමෙන් පසු සහ සියලු ආදායම් බැර කිරීමෙන් පසු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු.86,850,000/- ක් විය. සමාගමේ මුළු පිරිවැටුම රු.785,000,000/- කි.

(2) වෙනත් ආදායම් විස්තර:

| | **රු.** |
|---|---:|
| කුලී ආදායම (දළ) | 6,000,000 |
| ස්ථාවර තැන්පතුව මත පොලී ආදායම (දළ) | 10,700,000 |
| ලාභාංශ ආදායම - රඳවා ගැනීමේ බදු අඩු කළ පසු | 2,850,000 |
| පරිගණක උපකරණ ඉවත් කිරීම මත ලාභය | 1,200,000 |

(3) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම් (පිරිවැය) | 2022.04.01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් / අත්පත් කර ගැනීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2023.03.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ඉඩම | 8,250,000 | - | - | 8,250,000 |
| කාර්යාල ගොඩනැගිල්ල | 7,900,000 | - | - | 7,900,000 |
| මෝටර් වාහන | - | 6,500,000 | - | 6,500,000 |
| පරිගණක උපකරණ | 14,200,000 | - | 4,850,000 | 9,350,000 |
| **එකතුව** | **30,350,000** | **6,500,000** | **4,850,000** | **32,000,000** |

- සමාගම, සිය පැරණි පරිගණක රු.1,200,000/- ක මුදලකට විකුණා ඇත.
- බෙදාහැරීමේ වෑන් රථයක් වර්ෂය තුළදී මිලදී ගෙන තිබේ.
- විශේෂයෙන් සඳහන් කර ඇත්තම් හැර, සියලු වත්කම් 2017 මැයි මාසයේදී සමාගමේ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන විට මිලදී ගත් ඒවාය.

(4) පරිපාලන වියදම්හි පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.5,650,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.3,432,000/- කි.
- කුලියට දුන් දේපළ සඳහා කුලී ගිවිසුම අත්සන් කිරීම වෙනුවෙන් දරණ ලද නීති වියදම් රු.90,000/- කි.
- තක්සේරු වර්ෂය තුළදී, රු.1,000,000/- ක පිරිවැයක් දරමින් තෝරාගත් සේවකයින් පිරිසක් ප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයක තොරතුරු තාක්ෂණ (IT) පුහුණුවක් සඳහා යවන ලදී.

(5) බෙදාහැරීමේ වියදම් හි පහත දෑ ඇතුළත් වේ:

- සමාගමේ අනාගත ගැනුම්කරුවන්ට සංග්‍රහ කිරීම සඳහා රු.452,000/- ක් වියදම් කර තිබේ.
- අයකර ගැනීමේ ක්‍රියාමාර්ග රාශියකින් පසු, සමාගම, රු.325,000/- ක වෙළෙඳ ණයගැතියෙකු වර්ෂය තුළදී බොල්ණය ලෙස ලියා හැර ඇත. මේ සඳහා පෙර වර්ෂයේ කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොමැත. තවද, ආදායම් ප්‍රකාශනයේ රු.620,000/- ක අඩමාන ණය සඳහා පොදු ප්‍රතිපාදනයක් සිදුකර තිබේ.
- සමාගම, රු.1,800,000/- ක් වටිනා තොරතුරු තාක්ෂණ උපකරණ, ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග කර තිබේ.

(6) පරිපාලක සමාගමෙන් ලබාගත් කාරක ප්‍රාග්ධන ණය මුදල සඳහා ගෙවූ රු.550,000/- ක පොලිය, මූල්‍ය වියදම්වල ඇතුළත් වේ.

(7) වර්ෂය තුළදී සේවයෙන් ඉවත් වූ සේවකයෙකුට පාරිතෝෂික වශයෙන් රු.560,000/- ක් ගෙවා තිබේ.

(8) ස්ථාවර තැන්පතුව මත පොලිය 2023 පෙබරවාරි මස ලැබූ අතර, ඒ මත රඳවා ගැනීමේ බද්ද [Withholding Tax (WHT)] / අත්තිකාරම් ආදායම් බද්ද [Advance Income Tax (AIT)] ලෙස රු.535,000/- ක් බැංකුව විසින් අඩුකර ගෙන තිබුණි.

(9) 2022/23 තක්සේරු වර්ෂය සඳහා ස්ව-තක්සේරු පදනම මත ගෙවන ලද බද්ද රු.13,125,000/- කි.

(10) ව්‍යාපාරයේ අනෙකුත් සියලු වියදම්, ආදායම් බදු කටයුතු සඳහා ඉඩදෙනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත මොඩර්න් ටෙක් (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **ආනන්ද,** නීතිඥවරයෙක් වන අතර, ඔහු ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක නීති නිලධාරියෙකු ලෙස සේවය කරයි.

2022/23 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **ආනන්දගේ** ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

***(2022/23** තක්සේරු වර්ෂය තුළදී හඳුන්වාදෙන ලද ආදායම් බදු සංශෝධන, කාලපරිච්ඡේදය නොසළකා සම්පූර්ණ තක්සේරු වර්ෂය සඳහාම අදාල වන බව ඔබට සැළකිය හැකිය.)*

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසයකට රු.300,000/- ක් බැගින්.
- මාස භාගයක වැටුපට සමාන ප්‍රසාද දීමනාවක් 2022 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබේ.
- ඉන්ධන දීමනාව - මාසයකට රු.60,000/- ක් බැගින්.
- වර්ෂය තුළදී, ඔහු හදවත් සැත්කමකට මුහුණ දුන් අතර, රු.500,000/- ක සම්පූර්ණ රෝහල් බිල්පත 2022 නොවැම්බර් මාසයේදී සමාගම විසින් දරණ ලදී. සමාගමේ සියලු පූර්ණකාලීන සේවකයින් සඳහා සමාන කොන්දේසි මත වෛද්‍ය ප්‍රතිලාභ හිමි වේ.
- සමාගම, රියැදුරෙකු සමඟ වාහනයක් (1500 CC) සපයා තිබේ.
- වර්ෂය සඳහා අඩුකරන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] රු.856,800/- කි.

(2) ඔහු නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යන අතර, වර්ෂය සඳහා එහි ලැබීම් සහ ගෙවීම් විස්තර පහත දැක්වේ:

| | රු. | රු. |
|---|---|---|
| සේවාදායකයන්ගෙන් ලැබීම් | | 4,370,000 |
| **අඩු කළා :** ගෙවීම් | | |
| සහායකයාගේ වැටුප් | 600,000 | |
| සේවාදායකයන්ට සංග්‍රහ සඳහා | 200,000 | |
| කාර්යාල වියදම් | 660,000 | |
| ජායා පිටපත් යන්ත්‍රයක් මිලට ගැනීම | 330,000 | (1,790,000) |
| **ශුද්ධ ලාභය** | | **2,580,000** |

(3) වර්ෂය තුළදී, පහත සඳහන් පොලී ආදායම් **ආනන්ද** ට ලැබී ඇත:

| විස්තරය | ලැබුණු දිනය | මුදල (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් මත | 2022.11.01 | 900,000 |
| මිතුරෙකුට දුන් ණය මත | 2023.02.01 | 50,000 |

(4) **ආනන්ද** නිල ලැයිස්තුගත සමාගම් කිහිපයක කොටස්වල ආයෝජනය කර තිබෙන අතර, ඔහු කොටස් වෙළදාමෙන් රු.740,000/- ක ලාභයක්, 2022 දෙසැම්බර් මස උපයා තිබේ.

(5) 2023 ජනවාරි මාසයේදී නිල ලැයිස්තුගත සමාගම්වලින් ලැබුණු ලාභාංශ ආදායම (ලැබුණු ලාභාංශවලින් ගෙවන ලද) රු.450,000/- කි.

(6) 2022 දෙසැම්බර් මාසයේදී, ඔහු මහරගම අපේක්ෂා රෝහලට රු.250,000/- ක් පරිත්‍යාග කළ අතර, 2023 පෙබරවාරි මාසයේදී ළමා නිවාසයක් පවත්වාගෙන යන පුණ්‍යායතනයකට රු.50,000/- ක් පරිත්‍යාග කර තිබේ.

(7) 2022 දෙසැම්බර් මාසයේදී ඔහු, ඔහුගේ පාසැලේ ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික සුහද හමුව සඳහා රු.50,000/- ක අනුග්‍රාහකත්වයක් දක්වා තිබේ.

(8) 2022/23 තක්සේරු වර්ෂය සඳහා වාරික ගෙවීම් වශයෙන් ඔහු රු.600,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා **ආනන්දගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |